# දඩයම් ක්‍රම හා බැඳුණු ජනශ්‍රැති පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය දෝතළුඔය නාරද හිමි
සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය - ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
dothaluoyanarada2000@gmail.com

**සාරසංක්ෂේපය**

ජනයාගේ ශ්‍රැතිය ජනශ්‍රැතියයි. ඒ අනුව ජනතාව වෙතින් කටවහරෙන් පවත්වාගෙන එමින් ප්‍රවේණියෙන් ප්‍රවේණියට දායාද කර ඇති ඥානය ජනශ්‍රැතිය ලෙස අර්ථ දැක්විය හැකි ය. මෙම ජනශ්‍රැතිවල විවිධ ප්‍රභේද දක්නට ලැබේ. මෙම පර්යේෂණයේ අරමුණ දඩයම්ක්‍රම හා බැඳුණු ජනශ්‍රැතිය පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා පර්යේෂණ ගැටලුව වූයේ දඩයම් ක්‍රම හා බැඳුණු ජනශ්‍රැති කෙබඳු ද? එහි විවිධතා මොනවා ද? යන්න පැහැදිලි කර ගැනීමයි. මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම සඳහා ග්‍රන්ථ පරිශීලනය පර්යේෂණ ක්‍රමවේදය ලෙස භාවිත කරන ලදි. ඈත අතීතයේ සිට ම මිනිසා විසින් තම ආහාර අවශ්‍යතා සපුරාලීම පිණිස සත්ත්වයන් දඩයම් කළ බවට සාධක තිබේ. මිනිසා විසින් කල් යත් ම විවිධ වූ සිද්ධි හා අරමුණු පදනම් ව මේ හා සම්බන්ධ ව ජනශ්‍රැති ගොඩනගාගෙන ඇත. දඩයම් ක්‍රම හා නිර්මාණය වී ඇති කවි, ප්‍රස්තාව පිරුළු, ඉඟිවැකි, ජනකතා, තේරවිලි ආදිය මේ පිළිබඳ ව ඇති ජනශ්‍රැති සේ හඳුනා ගත හැකි ය. උදාහරණයක් ලෙස ප්‍රස්තාව පිරුළක් මෙසේ ය. **"ඇමක් දී මසෙකු අල්ලා ගත්තා වාගෙයි"** ඇම යනු මසුන් ඇල්ලීම පිණිස බිලී කොකුවට අමුණන කෑමකි. මෙය ජන සමාජයේ භාවිතයට ගෙන ඇත්තේ කෙනෙකු උපක්‍රමශීලී ව රැවටීම පෙන්වා දීමට ය. මෙලෙස විවිධ අදහස් ප්‍රකාශ කිරීමට මෙම ජනශ්‍රැති භාවිතයට ගෙන ඇත. යථෝක්ත අධ්‍යයනයේ දී ගම්‍ය වන්නේ දඩයම හා බැඳුණු ජනශ්‍රැති ඇති බවත් එහි විවිධතා දක්නට ඇති බවත් ය. මේවා කවදා කොතනක ආරම්භ වී දැයි නිශ්චිත ව ම කිව නොහැකි වුව ද ජනශ්‍රැතියේ පැවත එන බව සඳහන් කළ යුතු ය.

**ප්‍රමුඛ පදඃ** ගීත, ජනකවි, ජනශ්‍රැතිය, දඩයම් ක්‍රම, ප්‍රස්තාව පිරුළු

# A Study on Folklore Associated with Hunting Techniques

Ven. Dothaluoya Narada Thero
Department of Social Sciences and Comparative Studies
Bhikshu University of Sri Lanka
dothaluoyanarada2000@gmail.com

**Abstract**

Folklore is the wisdom that people pass down from one generation to the next. These folklorists appear to have been established to represent diverse regions. Studying the customs related to hunting techniques was the aim of this research. The following were the research questions: Is a folk tradition that relates to hunting methods? And what versions exist for it? To ensure the success of this study, the literature analysis approach was applied as the research methodology. It was feasible to investigate the hunting customs and traditions that had developed utilizing this research technique. There is proof that humans have been hunting animals for food since the beginning of time. It appears that human beings have produced a folk tradition dependent on many occasions and goals. The folklore surrounding this can be categorized as poems, metaphors, analogies, clues, folktales, and interpretations created using hunting techniques. One can use a metaphor as an illustration. The phrase "Amakdeemasekuallagaththavage" A food item called bait is used with a fishing rod to lure fish. Folklore has long used this phrase to refer to deceiving someone. As a result, this folk custom has been used to symbolize many distinct ideas. According to the study mentioned above, there is a folk tradition surrounding hunting that has a wide variety of variations. Although it is impossible to pinpoint a certain time or location

**Keywords**: Folklore, Folk Poems, Hunting Methods, Prastapirulu, Songs